5. විවිධ රැකියාවන්ට අදාළ වෘත්තිය ආරක්ෂාව සහ සෞඛ්‍ය ක්‍රියාමාර්ග භාවිතා කිරීම.

5.1 වෘත්තිය ආපදා පිළිබඳව විමසා බලයි.

හැඳින්වීම :-

ඈත අතීතයේ සිට මේ දක්වා සමාජ විකාශනය දෙස බැලු විට පෙනී යන ප්‍රධාන සාධකය නම් සෑම පුද්ගලයෙකුගේම ජීවිතය රදා පවතින ප්‍රධාන සාධකය රැකියාව බවයි. තම ආර්ථිකය ගොඩ නගා ගැනිමට මෙන්ම සමාජීය විවිධ අවශ්‍යතා සඳහා රැකියාව උපකාරී වේ.

අතීතයේ සිට වර්තමානය දක්වා විවිධ වෘත්තින්හි දියුණුව සිදු වු ආකාරය.

- පැවැත්ම උදෙසා මිනිසා විවිධ කාර්යාවල නිරත වීම
- මිනිසා සමාජීය වීම, සුවිශේෂි වු එක් කාර්යයක නිපුණ වීම සහ අවශ්‍යතා වෙනුවෙන් භාණ්ඩ හා සේවා හුවමාරු කර ගැනීම.

  උදා :- ධීවර කර්මාන්තය, කෘෂිකර්මාන්තය, කුඹල් කර්මාන්තය
- සමාජය සංකීර්ණ වන විට අසිමිත මිනිස් අවශ්‍යතා වෙනුවෙන් භෘණ්ඩ හා සේවා නිෂ්පාදන නිසා සේවා දායකයාගේ කාර්යය සංකීර්ණ විය.
- අධික වැඩ හේතුවෙන් වෘත්තිය, පුද්ගලයාගේ කායික මානසික හා සමාජීය සෞඛ්‍යයට බලපෑම් ඇති කිරීම හේතුවෙන් වෘත්තිය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ සියලු දෙනාගේ අවධානය යොමු වීම.

විවිධ වෘත්තීන් හා බැඳුණු, ආපදා අවස්ථා

- විදුලි සැර වැදීම
- යාන්ත්‍රික අනතුරු

  උදා:- ඉහළ සිට ඇද වැටීම, ශරීරය මතට බරක් වැටීම, ලිස්සා යෑම.
- රසායනික ද්‍රව්‍ය ශරීරගත වීමෙන් වන අනතුරු
- වැරදි ඉරියව් වලින් කාර්යයන්හි නිරත වීමෙන් වන අනතුරු
- අහිතකර පාරිසරික තත්ත්ව වලට (ශබ්දය, උෂ්ණත්වය. කම්පන,තීරණ) නිරාවරණය වීමෙන් වන අනතුරු
- මානසික ආතතිය, මානසික පීඩනය

මෙම ආරක්ෂිත තත්ත්ව හේතුවෙන් වෘත්තිකයාට මුහුණ දීමට සිදුවන හානිදායක අවස්ථා

- තාවකාලික දුබලතාවකට පත්වීම (Temporary disabilities)

උදා :- අතක් හෝ කකුලක් තාවකාලිකව දුබල වීම හෝ අහිමි වීම.

- කොටසක් ස්ථිර දුබලතාවකට පත්වීම. (Permanent partial disabilities)
- සම්පූර්ණයෙන් ස්ථිර දුබලතාවයකට පත්වීම. (Permanent disabilities)

උදා :- පූර්ණ අකර්මන්‍යතාවයට පත්වීම.

- මරණයට පත් වීම. (Death)

<u>වෘත්තිය අනතුරු/ රෝග හේතුවෙන් වෘත්තියාට ආයතනයට හා රටට සිදුවන සෘණාත්මක බලපෑම</u>

❖ වෘත්තියකට වන බලපෑම

1. අනතුරට ලක්වීම හෝ මරණයට පත්වීම.
2. රෝගී තත්ත්වයට පත් වීම.
3. ආර්ථික හා සමාජ ගැටලු ඇති වීම.

❖ ආයතනයට වන බලපෑම

1. ආයතනයේ ඵලදායිතාව අඩු වීම
2. නීතිමය කටයුතු සඳහා කාලය හා මුදල් වැය වීම.
3. නිෂ්පාදන වල තත්ත්වය පහළ බැසීම.
4. සේවකයන්ගේ උද්යෝගය අඩු විම නිසා නිෂ්පාදනය පහළ බසියි.
5. ආයතනයේ කීර්තිනාමයට හානි වීම.
6. කාලය අහිමි වීම හා පුහුණු සේවකයන් අහිමි වීම.
7. උපකරණ වලට හානි සිදු වීමෙන් අලුත්වැඩියා කිරීමට සිදුවීම.

❖ රටට සිදු වන බලපෑම

1. ඵලදායිතාව අඩු වීම
2. සමාජ ගැටලු ඇති වීම.

<u>වෘත්තිය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය - නිර්වචනය</u>

"ඕනෑම වෘත්තියක නියැලෙන වෘත්තිකයන් සියලු දෙනාගේ ශාරීරික, මානසික සහ සමාජීය යහ පැවැත්ම උපරිම මට්ටමෙන් ප්‍රවර්ධනය කිරීම සහ පවත්වා ගැනීම."

<u>වෘත්තිය ආපාදාව OHSAS 18002 : 2007 නිර්වචනය (Occupatioua) (Health and Safety Assessment Series)</u>

"මිනිසාට අනතුරුදායක තුවාලයක්, රෝගී තත්ත්වයක් හෝ මේ දෙකෙහිම එකතුවක් ළඟා කර දීමේ විභවයක් සහිත ප්‍රභවයක්, තත්ත්වයක් හෝ ක්‍රියාවකි.

වෘත්තිය ආපදා

කාණ්ඩ 2 කි.

1. වෘත්තිය අනතුරු

   රැකියාවෙහි නිරතව සිටිය දී ක්ෂණිකව සිදුවන සැලසුම් සහගත නොවු සහ බලාපොරොත්තු නොවු හානිදායක සිදුවීම් වෘත්තිය අනතුරු ලෙස හැඳින්වේ.

2. වෘත්තිය රෝග

   රැකියා කරන ස්ථානයෙහි අහිතකර තත්ත්වයන්ට (උදා : රසායනික, භෞතික හෝ ජෛවීය කාරක වලට) ගොදුරු විමෙන් කල් යෑමේ දී මතුවන රෝගී තත්ත්වයි.

වෘත්තිය ආපදා තත්ත්වයන්ට පාදක වු හේතු කාරණය මත වෘත්තිය ආපදා වර්ගීකරණය

1. භෞතික ආපදා (Physical Hazards)



- ආපදාවට හේතු වන්නේ යම් භෞතික ක්‍රියාවක් හෝ යම් ශක්තියක් නම් එය භෞතික ආපදාවකි.
- සැලසුම් සහගත නොවු හෝ බලාපොරොත්තු නොවු ආකාරයට ක්ෂණිකව සිදු වන බැවින් අනතුරක ස්වරූපයක් ගනී.

  උදා :-

  - කැඩීම්, බිඳීම්, තුවාල සිදු වීම, පිළිස්සීම, විදුලි සැර වැදීම.
  - දිර්ඝ කාලීනව බලපාන හේතු - X කිරණ, UV කිරණ, අධික ශබ්දය, නුසුදුසු අලෝකය කම්පන.

2. රසායනික ආපදා (Chemical Hazards)

ආපදාවට හේතු වන්නේ යම් රසායනික ද්‍රව්‍යයක් නම් එය රසායනික ආපදාවකි. මෙම රසායනික ද්‍රව්‍ය විෂ සහිත බව, ගිනි ගන්නා සුළු බව, පුපුරණශීලි බව, ප්‍රතික්‍රියාශීලි බව, ඛාදනයට ලක් වීම, විකිරණශීලි බව වැනි ගුණාංග වලින් යුතු වේ. පරිහරණයේ දී මුඛයෙන්, නාසයෙන් හා සම තුළින් ශරීරගත විය හැක.

ක්ෂණික හෝ දීර්ඝ කාලීන ආපදා ඇති විය හැක.

උදා :- ක්ෂණික මරණය, පිළිකා

- කෘෂි කර්මාන්තය - කෘමි නාශක
- සුවඳ විලවුන් කර්මාන්තය - බෙන්සින් වැනි කාබනික ද්‍රව්‍ය
- ඛණිජ තෙල් කර්මාන්තය
- තීන්ත කර්මාන්තය.

3. ජෛවීය ආපදා (Biologocal Hazards)

ආපදාවට හේතු කාරක වන්නේ ජීවියෙක් නම් එවැනි ආපදා ජෛවීය ආපදා ලෙස හැදින්වේ.

- ක්ෂුද්‍ර ජීවීන් - බැක්ටීරියා, දිලීර, වෛරස රෝග, පාචනය, සමේ ආසාදන
- සත්ව සපා කෑම්, දෂ්ට කිරීම්.
- මී - මී උණ, සර්පයින් - විෂ වීම්, මදුරුවන් - ඩෙංගු, බඹරුන් - විෂවීම්

4. ශ්‍රම සුක්ෂම ආපදා (Ergonomic Hazards)

මිනිස් සිරුර වැරදි ඉරියව් වල පිහිට වීම නිසා ඇති වන ආපදා තත්ත්ව මෙලෙස හැදින්වේ. වෘත්තියේ නියැලීමේ දී සේවකයාගේ අස්ථි, පේශී සහ ස්නායු පද්ධතියට හානිදායක නොවන ආකාරයේ ඉරියව් පවත්වා ගැනීම, යන්ත්‍රෝපකරණ සහ මෙවලම් ආදිය භාවිතා කිරීම " සුබෝපයෝගී විද්‍යාව" ලෙස හැදින්වේ.

ඇතිවන ආපදා - කොන්දේ අමාරුව, බෙල්ලේ අමාරුව, නහර ගැට ගැසීම

5. මනෝසමාජීය ආපදා (Psycho social Hazards)

දුර්වල පෞරුෂයක් සහ මානසික තත්ත්වයක් ඇති ආයතන ප්‍රධානීන් මගින් යටත් සේවකයන් හට මෙවැනි ආකාරයේ ආපදා සිදු වීමට ඉඩ ඇත. (ආතතිය, ප්‍රචණ්ඩත්වය) එසේම,

- අධික වැඩ ප්‍රමාණ හා වැඩ මුර ක්‍රමය
- ආයතන තුළ ඇති දැඩි නීති රීතී
- තරඟකාරීත්වය මෙයට හේතුවේ.

ප්‍රතිඵලය :-

- අධි රුධිර පීඩනය
- හෘද රෝග
- දියවැඩියාව
- කොලොස්ටරෝල්
- අර්ශස්
- මානසික රෝග

5.2 ආරක්ෂණ විගර්ගනය සිදු කරමින් වෘත්තිය ආපදා වළක්වා ගැනීම.

ආරක්ෂක විගණනය (Safety audit)

වෘත්තිය ආපදා හේතුවෙන් විය හැකි හානිදායක තත්ත්ව වළක්වා ගැනීමට හෝ අවට කිරීමට නම් සිදු කළ යුතු වන්නේ ආපදා ඇති වීමට හේතු පාදක විය හැකි සාධක මුලින්ම හඳුනා ගැනීමයි. මෙලෙස ආපදා හදුනා ගැනිමේ ක්‍රමයක් ලෙස "ආරක්ෂක විගණනය" හැදින්විය හැකිය.

ආරක්ෂක විගණනය සිදු කිරීමේ පියවර

1. ආරක්ෂණ විගණන කණ්ඩායමක් (Safety audit team) පත් කිරීම.
   - **කම්කරු ආරක්ෂණ නිලධාරියෙකු හා සේවා ස්ථානයේ විවිධ ක්‍රියාකාරකම් පිළිබඳ අවබෝධයක් ඇති සේවකයන් කිහිප දෙනෙකු ඇතුළත් වීම.**
2. පිරික්සුම් ලැයිස්තු (Check list) සෑදීම.
   - **යන්ත්‍රෝපකරණ පිළිබඳ නිෂ්පාදන ආයතනය සපයා ඇති ආරක්ෂක උපදෙස් අවධාරණය කිරීමෙන් හා ආයතනය තුළ පෙර සිදු වු ආපදා අධ්‍යයනය කිරීමෙන් ආපදා අවස්ථා හදුනා ගැනිම.**
3. ආපදා ඇගයීම (Hazard assessment)
   - **ආපදා විශ්ලේෂණය (Risk analysis) මගින් ආපදාවේ බලපෑම / විය හැකි හානියේ ප්‍රමාණය තක්සේරු කිරීම.**
4. අන්තර්ජාතික ප්‍රමිති භාවිතය
   - **වැඩබිමේ පරිසර තත්ත්ව (වායු සංයුතිය, ශබ්දය, උෂ්ණත්වය, දුවිලි මට්ටම ආදිය) ආපදාවට හේතු සාධක වන විටදී,**

   ශ්‍රී ලංකාවේ දී එම වාර්තා කම්කරු දෙපාර්තමේන්තුවේ සුරක්ෂිතතා අංශයෙන් (Industrial Safety division) හෝ ජාතික වෘත්තිය ආරක්ෂාව හා සෞඛ්‍ය ආයතනයෙන් ලබා ගත හැක.

5. හදුනාගත් අවදානම් තත්ත්ව වැළැක්වීමේ හා අවම කිරීමේ ක්‍රම සොයා බැලීම.
   - **ඒ සඳහා ආයතන කළමණාකරුවන්ගේ සිට ආවරක්ෂණ විගණන කණ්ඩායමේ සාමුහික එකඟතා මත විසදුම් යෝජනා ඉදිරිපත් කිරීම.**
   - **තව ද ආපදා වැළැක්වීමේ ධුරාවලියේ සහාය ලබා ගැනීම.**

ආපදා වැළැක්වීමේ ධූරාවලිය

මෙමඟින් ආයතනයක ආපදා වැළැක්වීමට ගත හැකි ක්‍රියාමාර්ග හදුනා ගත හැක.



ධූරාවලිය අනුව ආපදා වැළැක්වීමේ කාර්යක්ෂමතාවය ඉහල සිට පහළට අඩු වේ. එබැවින් ආපදා වැළැක්වීමේ පූර්ව ක්‍රියාමාර්ග ගැනීමට ඉතා සැලකිලිමත් විය යුතුය.

1. ආපදාව ඉවත් කිරීම (Elimiuation)

   අවදානමක් ඇති සාධකය සම්පූර්ණයෙන් ඉවත් කිරීම හෝ අවදානම සහිත ස්ථානයෙන් සේවකයා සම්පූර්ණයෙන් ඉවත් කිරීම හෝ සිදු කෙරේ.

   උදා :-
   - උස් ස්ථානයක සිට කරන වෘත්තියක් පහළ ස්ථානයක සිට කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම - භෞතික ආපදා
   - අබලන් වූ කැඩුණු බිඳුණු විදුලි උපකරණ අළුත්වැඩියාව
   - බර එසවීමට ෆොක් ලිෆ්ට් භාවිතය

2. විකල්ප/ ආදේශක භාවිතය (Substitution)

   ආපදාවක් ඇති විය හැකි ක්‍රියාවලියක් ඇත්නම් එම ක්‍රියාවලියට බාධාවක් නොවන සේ පවත්වාගෙන යන ක්‍රමය වෙනස් කිරීම හෝ අවදානමක් ඇති ද්‍රව්‍ය වෙනස් කිරීමෙන් අවදානම අඩු කිරීම.

   - පුපුරන ද්‍රව්‍ය යොදාඋමං හෑරීම වෙනුවට උමං හෑරීමේ යන්ත්‍ර භාවිතය - භෞතික ආපදා
   - කෘෂි කර්මානත්යේ දී රසායනික පළිබෝධ වෙනුවට කාබනික පලිබෝධනාශක භාවිතය - රසායනික ආපදා
   - කසල ඉවත් කිරීමට නවීන උපකරණ භාවිතය - ජෛවීය ආපදා

3. ඉංජිනේරුමය ක්‍රියාමාර්ග ගැනීම (Engineering Control)

වැඩිම, යන්ත්‍ර සූත්‍ර හෝ ක්‍රියාවලිය අවදානම් අවම වන සේ නිර්මාණය කිරීම.

- තාපය, තීරණ, කම්පන සහිත අවදානම් ස්ථාන වල ක්‍රියාකාරීත්වය පාලනයට දුරස්ථ පාලක භාවිතය
- ගැඹුරු ළිදකින් වතුර ඇදීම වෙනුවට මෝටරයක් භාවිතය

4. පරිපාලන ක්‍රියාමාර්ග ගැනීම (Administrative Contriol)

අවදානම් අවම වන ලෙස සම්පත්, උපකරණ සහ පිරිස් කළමණාකරණය සහ සේවා මුර සකස් කිරීම ආදිය මෙයට අයත් වේ.

උදා :-

- අවදානම් ස්ථානවල ආරක්ෂණ සංඥා, පුවරු උපදෙස් පුවරු සවි කිරීම.
- රසායන ද්‍රව්‍ය භාවිතා කරන ස්ථානවල ඒවා නිවැරදි ලෙෂත්, ආරක්ෂාකාරී ලෙෂත් නම් කර ගබඩා කිරීම.
- අහිතිකර රසායන ද්‍රව්‍ය වලට සහ ශක්තීන්ට නිරාවරණය වන කාලය අවට වන ලෙස සේවා මුර කෙටි කිරීම.

5. පුද්ගල ආරක්ෂණ උපකරණ භාවිතය (Personal Protective Equipment - PPE)

භෞතික, රසායනික සහ ජෛවීය ආපදා අවස්ථා වලට නිරාවරණය වීම අවම කිරීම සඳහා සේවකයාගේ ශරීරය හෝ ශරීරයේ යම් කොටසක් ආවරණය වන පරිදි සකස් කළ උපකරණ හෝ පළඳනා භාවිත කිරීමෙන් අවදානම අවම කිරීම.

එසේම ශරීරය ආවරණ කිරීමට අමතරව කාර්යය පහසු කිරීම සඳහා මෙවලම් රඳවා ගැනීම මගින් ශ්‍රම ආපදා අවම කර ගැනීමට ද හැකි ලෙස පළඳින පැළඳුම් ද මීට අයත්ය.

උදා :- ජැකට්, බුස්ට්, ග්ලවුස්.

5.3 වෘත්තිය ආරක්ෂාවට සහ සෞඛ්‍යයට අදාළ ප්‍රමිත හා රෙගුලාසි

වෘත්තිය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය නිසි ලෙස පවත්වා ගැනීමට අදාළ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ආඥා පනත්.

1. 1942 අංක 45 දරණ කර්මාන්ත ශාලා ආඥා පනත

අරමුණ :-

ශ්‍රී ලංකාවේ කර්මාන්තශාලා වල සේවය කරන සේවකයන්ට ශාරීරික හෝ සෞඛ්‍යමය ලෙස සිදු විය හැකි අනතුරු වලින් සේවකයන් ආරක්ෂා කර ගැනිම.

ආවරණය වන කරුණු :-

- කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග
- ගොඩනැගිල්ල අනුමත කරවා ගැනීම.
- දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා හෝ කම්කරු කොමසාරිස්වරයා සැලසුම අනුමත කළ යුතුය.
- කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීමෙන් පසු සේවා යෝජකයා විසින් පවත්වා ගත යුතු තත්ත්ව
- කර්මාන්ත ශාලා පිරිසිදු කිරීමේ ක්‍රමවේද
- කර්මාන්ත ශාලාව තුළ පවත්වා ගත යුතු තත්ත්ව
  උදා :- උෂ්ණත්වය, වාතාශ්‍රය, අලෝකය,
- සුබසාධක පහසුකම්
- චලනය වන කොටස් (දඬු, දැති රෝද, කප්පි, පටි) පවත්වාගන්නා, නඩත්තු කරන, ආවරණය කිරීම.
- හදිසි ගින්නක දී, විදුලි සැර වැදීමක දී ක්‍රියාකලයුතු ආකාරය හා පූර්ව ආරක්ෂිත උපක්‍රම
- වැඩකරන ස්ථානයට ආරක්ෂාකාරීව ළගා වීමේ පහසුකම් හා ස්ථානයේ ආරක්ෂාව පිළිබඳ ක්‍රමවේද
- කර්මාන්ත ශාලාව තුළ යම් අනතුරක් සිදු වු විට ක්‍රියාකළ යුතු ආකාරය සහ අනතුර පිළිබඳ දිස්ත්‍රික් කර්මාන්ත ශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා වෙත දැනුම් දිම සහ කර්මාන්ත ශාලාව තුළ දී ඔහුගේ බලතල
- ක්‍රියාත්මක කරනු ලබන්නේ කම්කරු දෙපාර්තමේන්තුවේ කර්මාන්ත සුරක්ෂිතතා අංශය (Industrial Safety division) මගිනි.

1. 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පනත

අරමුණ :-

යම්කිසි වෘත්තියක යෙදී සිටිය දී සිදු වු අනතුරක් සම්බන්ධයෙන් හෝ කාලයක් යම් වෘත්තියක නියැලිමෙන් වැළඳුන රෝගයක් සම්බන්ධයෙන් යම් නිශ්චිත වන්දියක් ගෙවීමට සේවා යෝජකයා වෙත පැවරීම.

ආවරණය වන කරුණු :-

- වන්දි හිමිකරුවන්
- ශ්‍රී ලංකා යුද හමුදා සේවයේ සහ ශ්‍රී ලංකා පොලිස් සේවයේ නිරත වන්නේ හැර අනෙක් සෑම සේවකයෙකුටම මෙම පනත මගින් වන්දි ලබා ගැනීමට හිමිකම ඇත.
- සේවකයා මිය ගිය අවස්ථාවක දී (වෘත්තිය අනතුරක් හෝ වෘත්තිය රෝගයෙන් හේතුවෙන්) වන්දි හිමි වනුයේ අනතුරට පත් අයගේ යැපෙන්නන්ට පමණි.
- වන්දි ලබා දිමට සේවා යෝජකයා බැදී නොමැති අවස්ථා

  අනතුරු සිදු වන විට දී බිමත්ව සිටිම.

  හිතාමතාම දී ඇති සුරක්ෂිතතා ආවරණ හෝ උපක්‍රම භාවිතා නොකිරීම.

<u>**වන්දි ලබා ගන්නා ආකාරය**</u>

- වෘත්තිය අනතුරක් හෝ රෝගයක් බවට වෛද්‍ය ආඥා පනත යටතේ ලියාපදිංචි වෛද්‍යවරයෙකුගෙන් ලබා ගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කිරීම.
- වෘත්තිය අනතුර/රෝගය පිළිබඳ සේවා යෝජකයා දැනුවත් කිරීම.
- සේවා යෝජකයා වන්දි ලබා දීම ප්‍රතික්ෂේප කරන විටක දී කම්කරු වන්දි කොමසාරිස්වරයා වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම.

<u>**වෘත්තිය සුරක්ෂිතතාව හා සෞඛ්‍යයට අදාළ ප්‍රමිති**</u>

(1) ISO 9000

- භාණ්ඩ හා සේවා වල තත්ත්වය පිළිබඳ වු තත්ත්ව සහතිකයයි. මෙහි දී නිෂ්පාදන ක්‍රියාවලිය නිසි කළමණාකරණයකින් පවත්වා ගැනිම සිදු කරනු ලබන අතර, එහි දී ද නිෂ්පාදන ක්‍රියාවලිය හා සම්බන්ධ අනතුරු අවම වේ.

(2) ISO 14000

- සේවා ස්ථානයේ පාරිසරික තත්ත්වය පිළිබඳව වු තත්ත්ව සහතිකයයි. මෙහි දී ද සේවා ස්ථානයේ පරිසර තත්ත්වය යහපත්ව පවත්වා ගැනීමෙන් සේවකයින්ගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ යන අතර, වෘත්තිය රෝග වල ගොදුරු වීමේ ඉඩ ප්‍රස්තාව අඩු කරයි.

(3) OHSAS 18001

- සේවා ස්ථානයේ වෘත්තිය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය ඉහළ නැංවීමේ කළමණාකරණ ක්‍රියාවලිය හා සෘජුව බැදුණු තත්ත්ව සහතිකයි. මෙහි දී ආයතන වල සේවක ආරක්ෂාව හා සෞඛ්‍ය තත්ත්ව පිළිබඳ ආළ ක්ෂේත්‍රයට අනුව සකසන ලද ජාත්‍යන්තරව පිළිගත් නිර්ණායක (ILO) භාවිතයෙන් බලයලත් ආයතනයත් (SLS) විගණනයක් සිදු කර මෙම තත්ත්ව සහතිකය පිරිනමයි.

<u>තත්ත්ව සහතික ලබා ගැනීමේ වැදගත්කම</u>

- තත්ත්ව සහතික මගින් අදාළ ආයතනය ජාත්‍යන්තර පිළිගැනීමකට ලක්වීම.
- ඒ මගින් භාණ්ඩ හා සේවා සඳහා එම ආයතන වලට දක්වන ඉල්ලුම ඉහළ යයි.
- වෙළඳපොල තුළ ඉහළ ආදායම් ලැබීමට එය හේතු වේ.

<u>වෘත්තිය සෞඛ්‍යයට අදාළව ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (International Labour Organization - ILO) කාර්යභාරය හා එහි ප්‍රමිති</u>

- ඒ ඒ රටවල වඩ කරන ජනතාවගේ සේවා තත්ත්වය සහ අයිතීන් උසස් කරලීම සඳහා රටවල් බොහෝමයක් එක්ව සාදා ගත් සංවිධාන ව්‍යුහයක් "ජාත්‍යන්තර කම්කරු සංවිධානය " නමින් හැදින්වේ.
- මෙමඟින් වෘත්තිය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පවත්වා ගැනීමට අදාළව විවිධ ප්‍රමිති හදුන්වා දෙනු ලබයි. සමාජික රටවල් එම සම්මුති වලට එකඟත්වය පළකරයි. (ශ්‍රී ලංකාවට ILO හි සාමාජික රටකි)
- මෙහි සාමාජිකත්වය දැරීමෙන් එම රට සේවක සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පවත්වා ගන්නා බවට විශ්වාසනීය සහතිකයක් දරයි.
- විදේශ රැකියා තෝරා ගැනීමේ දී මේ පිළිබඳව විමසිලිමත් වීම ප්‍රයෝජනවත් වනු ඇත.